අල්ලාහ්ගේ දූතයාණන්-සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා රාත්රියෙන් තුනෙන් පංගුවක් ගෙවී ගිය විට, නැගී සිට “අහෝ ජනයිනි, ඔබ අල්ලාහ්ව මෙනෙහි කරනු“ යැයි පවසන්නෙකු වූහ.

උබෙය් ඉබ්නු කඃබ් -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී.“අල්ලාහ්ගේ දූතයාණන්-සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා රාත්රියෙන් තුනෙන් පංගුවක් ගෙවී ගිය විට, නැගී සිට “අහෝ ජනයිනි, ඔබ අල්ලාහ්ව මෙනෙහි කරනු. සැබැවින්ම සූර්- නළාව පිඹින පළමු දිනය පැමිණ ඇත.එයට පසුව දෙවන සූර් නළාව පිඹීම හඹා එනු ඇත. මරණය එහි ඇති දෑ සමග පැමිණෙනු ඇත. මරණය එහි ඇති දෑ සමග පැමිණෙනු ඇත.“ “අල්ලාහ්ගේ දූතයාණනි, සැබැවින්ම මම ඔබ වෙත අධික වශයෙන් සලවාත් පවසමි. මා සලාවාත් පැවසීමෙන් කොපමණ ප්රමාණයක් ඔබ වෙනුවෙන් වෙන් කර තැබිය යුතුද?“ යැයි විමසුවෙමි. එවිට “ඔබ අභිමත කරන තරමක්“ යැයි පැවසූහ. “මම, හතරෙන් එකක ප්රමාණයක්?“ දැයි විමසා සිටියෙමි. “ඔබ කැමති ප්රමාණයක්, ඔබ එය අධික කර ගන්නෙහි නම් එය ඔබට යහපතක් වනු ඇත.“ යැයි පැවසූහ. “තුනෙන් දෙකක ප්රමාණයක්?“ දැයි විමසුවෙමි. “ඔබ කැමති ප්රමාණයක්, ඔබ එය අධික කර ගන්නෙහි නම් එය ඔබට යහපතක් වනු ඇත.“ යැයි පැවසූහ. පසුව “මා පවසන සලවාත් සඳහා සියල්ල ඔබ වෙනුවෙන් පත්
කරමි“ යැයි පවසා සිටියෙමි. “එසේ නම් ඔබේ උත්සහය ඔබට ප්රමාණවත් වේ. ඔබේ පාපයට ඔබට සමාව දෙනු ලබනු ඇතැයි“ පවසා සිටියහ. [හසන් ගණයට අයත් හදීසයකි] [ඉමාම් තිර්මිදි එය වාර්තා කර ඇත - අහ්මද් එය වාර්තා කර ඇත]

හදීසය ආරම්භයේ නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා රාත්රියෙන් තුනෙන් පංගුවක් ගෙවී ගිය විට නැගී සිට නොසැලකිලිමත්ව සිටින තම සමූහයා දැනුවත් කරමින් අල්ලාහ්ගේ පූර්ණ ආශිර්වාදයෙන් ඔහුගේ තෘප්තියට පත්වනු පිණිස එහි ලැබෙන්නට යන දෑ සඳහා උනන්දු කරවමින්, “අහෝ ජනයිනි! අල්ලාහ්ව මෙනෙහි කරනු“ යැයි පැවසූහ. දැහැමි දෑ අධිකව කිරීම තුළින් හා ඒ හැර වෙනත් දෑ අතහැරීම තුළින් අධික වශයෙන් සිදු කරන දික්ර්හි ඵලයෙන් ස්වර්ග උයන් ඵලබර උසුලනු ඇත. එම හදීසයේ තවදුරටත් සලකා බලන විට, ඉල්ලා සිටින්නාගේ පැතුම ඔහු වෙනුවෙන් කරන පැතුමක් විය යුතුය. නමුත් ඉන් තුනෙන් කොටසක් නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා වෙනුවෙන් කරන පැතුමත් බවට පත් කර ගත හැක. එසේ නැතිනම් එතුමා වෙනුවෙන් අඩක් වෙන් කර ගන්නට පුළුවන, එසේත් නොමැතිනම් ඔහුගේ ප්රාර්ථනාව සම්පූර්ණයෙන්ම එතුමා වෙනුවෙන් වන්නට පුළුවන. එය තමන් වෙනුවෙන් පතන ප්රාර්ථාන වෙනුවට සම්පූර්ණයෙන් එතුමාණන් වෙත සලාවාත් පවසා සිටින්නාක් මෙනි. තවත් හදීසයක මෙසේ එය තහවුරු කර සිටියි. “කවරෙකු එතුමා වෙනුවෙන් වරක් සලවාත් පවසන්නේ ද අල්ලාහ් එතුමා වෙත දස වාරයක් සලවාත් පවසනු ඇත. මෙය ඉමාම් මුස්ලිම් තම සහීහ් ග්රන්ථයේ සඳහන් කර ඇත. (1/306 අංක 408) අබූ හුරෙය්රා තුමා විසින් වාර්තා කළ හදීසයක. ඔහුගේ සලවාත්වල කුසල් පූර්ණ වශයෙන් ඔහුට හිමි වනු ඇත. එහෙයින් එතුමා, “ඔබේ උත්සහය ඔබට ප්රමාණවත් වෙයි. ඔබේ පාපයන්ට සමාව දෙනු ලැබේ“ යැයි පවසා සිටියහ. එනම්, “නියත වශයෙන්ම පසුවට දුක ඇති කරන, පාපය අනිවාර්යය කරන යම් කරුණකින් ඉවත් වීමට ඔබ ඉල්ලා සිටින්නේ නම්, ඔබේ පැතුම වෙනුවට මා වෙත සලවාත් පවසන්නේ නම් ඔබේ අපේක්ෂාවන් සිදුවනු ඇත.“ මෙම හදීසයේ ප්රාර්ථනාවන්හි එතුමාව ඇතුළත් කර ගත යුතුයි යන්න අදහස් කෙරේ. එය, “මම මා වෙනුවෙන් අයැද සිටින සෑම කල්හිම ඔබ වෙත සලවාත් පවසමි“ යනුවෙන් පවසනවාක් මෙනි.

ප්රාර්ථනාවෙන් තොරව සලවාත් පැවසීම පමණක් ප්රමාණවත් වේ යන්නට මෙය සාධකයක් ලෙස ගත යුතු නොවේ. නමුත් මේ සම්බන්ධයෙන් සඳහන්ව ඇති සියලු සාධක ක්රියාවට නංවමින් ඒ දෙක අතර මධ්යස්ත තීරණයක් ගත යුතුව ඇත.

http://www.sunnah.global/hadeeth/si/show/6181